# දේශපාලන අවමංගල්‍යයක ගමන් කරන මංගල




අපේ රටේ දේශපාලනය කුණු වී ඕජස් ගලන තත්ත්වයට පත්වූයේ අද ඊයේ නොවේ, අතීසාරයට අමුඩ ගසන දේශපාලනඥයන් සහ තුවාල සුව නොකර හිඟමනේ යෙදෙන දේශපාලනඥයන් මෙන්ම එය ගණිකා වෘත්තියේ යොදවන දේශපාලනඥයන්ගෙන්ද පිරී පවතින අපේ රටේ අළුත්ම දේශපාලන තුවාලය බිහිවූයේ ඊයේ පෙරේදාය. ඒ මංගල සමරවීර සහ ශ්‍රීපති සූරියආරච්චිගේ දේශපාලන පක්ෂයයි. රජයට විරුද්ධ එහෙත් රජයේ සිටින, විපක්ෂයේ අසුන් ගන්නා දේශපාලන පක්ෂයක් වශයෙන් ඉතිහාස-යට එකතු වන මෙම දේශපාලන පක්ෂයේ අළුත්ම අරමුණ වන්නේ රජයේ සිටින එහෙත් කළකිරී ඇති මන්ත්‍රීවරු සහ ඇමැතිවරු එකතු කර, එජාපය සමඟ එකතු වී රජය බිඳ වැට්ටවීමය.

මංගල සමරවීර නැමැති චරිතය වඩාත් ජනප්‍රිය වන්නේ 1993 චන්ද්‍රිකා බණ්ඩාරනායකට බලය ලැබීමත් සමඟය. චන්ද්‍රිකාගේ සුවච කීකරු ගෝලයකු ලෙස පක්ෂපාතිව කටයුතු කළ මංගලට රජයේ ඉහළම ඇමැති තනතුරු ප්‍රධානය කෙරිණි. ඊටපසු ඔහු තම පෞද්ගලික චරිතය අතින්ද, එසේම මහ සංඝරත්නය විවේචනය කිරීම නිසා ඇතිවූ ආන්දෝලනයෙන් ලබාගත් ප්‍රසිද්ධිද හේතුකොට ගෙන ලාංකික ජනතාව අතර වඩාත් කතා බහට ලක්වන දේශපාලනඥයකු බවට පත්විය. එකල චන්ද්‍රිකා රජයේ සිටි මහ ලේකම් එස්.බී. දිසානායකගේ ළඟම මිතුරකු ලෙස සිට එහෙත් එස්.බී. - චන්ද්‍රිකා සටනේදී චන්ද්‍රිකාගේ පැත්ත ගෙන එස්.බී. ව විපක්ෂය දක්වා තල්ලු කර, ඔහුගේ දේශපාලන සතුරකු වශයෙන් ක්‍රියාකළ මංගල, මහින්ද රාජපක්ෂව ජනාධිපති කිරීමට අකමැත්තෙන් හෝ තම හස්තය දිගු කලේ අගමැතිකම ලබා ගැනීමට බව කවුරුත් දන්නා රහසකි. එහෙත් ඔහුගේ තව අරමුණක් වූයේ චන්ද්‍රිකාව පක්ෂයේ නායිකාව වශයෙන් දිගටම තබා ගෙන ඇයව පාර්ලිමේන්තුවට ගෙන ඒමටය. පවතින ව්‍යවස්ථාවන් හා අනෙකුත් බාධක හමුවේ එම අරමුණ ඉෂ්ඨ නොවූවත්, ඔහු චන්ද්‍රිකාගේ මිතුරකු වශයෙන් තවදුරටත් කටයුතු කළේය.

තම අරමුණු මහින්ද ලවා ඉටු කරවා ගැනීමට නොහැකි වූ කල ඔහු රජය හා මහින්දව විවේචනය කිරීමට පටන් ගත්තේය. එම ප්‍රතිඵලයට අනුව ඔහු රනිල්ගේ මිතුරෙකි. මහින්දව බලයට පත් කිරීමට රනිල්ව හා ඔහුගේ ප්‍රතිරූපයට තමා සෑහෙන අපහාස කල බවත්, ඒ පිළිබඳව තමා කණගාටු වන බවත්, මංගල දැන් ප්‍රකාශ කරන අතර, ජනාධිපතිවීම සඳහා මහින්ද ප්‍රභාකරන්ට අල්ලස් ගෙවූ බවත්, ශ්‍රීපති සමඟ එක්ව අද ඔහු ප්‍රකාශ කරයි. අද අපේ දේශපාලන ගැත්තන්ගේ ඉහමොල කොතෙක් කුණු වී ඇත්ද යන්න ඉහත කාරණාවලින් වඩාත් පැහැදිලි වන අතර, අද ඔහුගේ සහ රනිල්ගේ ප්‍රධාන අරමුණ වන්නේ රජය පෙරළීමය. එහෙත් පෙරළා ජනතාවට කුමක් ලබා දෙන්නේද යන්න තවමත් ඔවුන් එක්සත්ව ප්‍රකාශ කර නැත. මංගලගේ දේශපාලන ගමනේ අවමංගල්‍ය පටන් ගන්නේ මෙතැනනි.

බලය ලබා ගැනීමට ඕනෑම කුණු ගොඩක් සමඟ එකතු වන ප්‍රධාන විපක්ෂය අද කොතෙක් දුරට බංකොලොත් වී ඇත්දැයි කියතොත් ආණ්ඩු පක්ෂයේ සිට හෙවනැල්ලක් වුවද බාර ගැනීමට ඔවුන් අද සූදානම්ය. මංගලගේ සන්ධානයට විරුද්ධව අද එස්.බී. ප්‍රවෘත්ති නිකුත් කරන අතර මෙතෙක් කල් රජය තදින් විවේචනය කිරීම මඳක් බාල කරමින් නැවතත් මහින්ද සමඟ එකතුවීමට එස්.බී. සරම කැසපොට ගසයි. මේ දේශපාලනඥයන්ගෙන් අපේ රටට යහපතක් සිදුවේද? අන්ද මන්ද වී ඇති රටේ ජනතාවට සැබෑ නායකයෙක් කවදා පහල වේවිද? අපේ රටට නිසි ක්‍රමවේදයක් අනුව ප්‍රතාපවත්, අව්‍යාජ නායකයෙකු බිහි කිරීම හෝ බිහිවීම තවත් ශතවර්ෂයක් කරා යාවිද? බසයේ යන ගමන් ගාස්තුවලින් උසස් පෙළ හදාරණ තම දියණියට අඩිකෝදුවක් මිලට ගෙන දහදිය හෙලමින් සැතපුම් ගණන් පයින් යන පියවරුන් සිටින, තුන්වේලෙන් එකවේලක් නොකා, එම මුදලින් ගෙවල් කුලී ගෙවන දරු පවුල් සිටින, තම වැටුපටත් වඩා මසකට අහලපහල කඩවලට ණය වෙන ජනතාවගෙන් පිරි අපේ රටේ දේශපාලනඥයන්ගේ ගමන් මග මෙයද? මේවාට පිළිතුරු සෙවීමට ජනතාව උත්සුක නොවන්නේ මන්ද?

අද අපේ රටේ සිටින්නේ වාරුණි ජාතකයේ එන වෙළන්දන් මෙන් රාවලට ලුණු එකතු කරන දේශපාලනඥයන්ය. අපේ රටේ ජනතාව බලය ලබා දෙන්නේද එවැනි දේශපාලනඥයන්ටය. අන්තිමේදී ලුණු වැඩිවීමෙන් රා බොන්නට නොහැකි කල ජනතාව කඳුළු සලමින් නිසොල්මන් වෙයි.

එම නිසා වාරුණි ජාතකයෙන් අපේ රටේ ජනතාවට මෙන්ම දේශපාලනඥයන්ටද වැදගත් පණිවිඩයක් ලබාදෙයි. ඒ නුවණක් නැති පුද්ගලයන් කාට වුවද යහපතක් කරන්නේය යැයි සිතා කරන්නේම අනුවණකම් හා අයහපතක්ම යන්නය.

## කවි කොළය

මන්තිරි හාමුදුරුවන් සැප කාර් ටික
විකුණා දමා කරනා සාසන සේවේ
බලං ඉන්න බැරි තැන මිසදුටු ඇත්තෝ
නගනා හඬට එරෙහිව මේ ලෙස ලියමී

බදු අඩු කරන් ලැබගත් සැප කාර් ටික
නිවනට යන්න එරෙහිව බාදාවක් ය
මහජනතාව ගොන් වෙනුවට බැඳගත්ත
කරත්තයෙන් නිවනට වඩිනව සත්තයි

